ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,241 — 1936ක්වූ අගෝස්තු මස 28 වෙනි දිනවූ සිකුරාදා.

# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,394 (කොළඹ).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 28වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒවා කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1936ක්වූ ජූලි මස 3වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඇස්. ඈෆ්. අමරසිංහ,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක
උප ඒජන්තතුමා වම්හ.

(a) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

(c) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුළත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරනු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

### උපලේඛනය.

බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලයේ මැදපත්තුවේ වගයන ගමේ පිහිටි මෙහි පහත සඳහන් බිම්කට්ටි, එනම්:—

#### I.—කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 49.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 68 | දුල්හේන්කන්ද | 0 | 1 | 10 |
| 76 | එම | 181 | 0 | 33 |
| | | 182 | 1 | 3 |

මීට මායිම්—උතුරට 49 කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 47 දරන බිම්කට්ටිය ; නැගෙනහිරට 49 කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 50 දරන බිම්කට්ටිය, කොස්දෙල, 2,367 බදු සිතියමේ සඳහන් ඉඩම සහ 223,120 පිඹුරේ පිට අයිතිවාසිකම්කියන ඉඩම ; දකුණට 223,121 පිඹුරේ සඳහන් ඉඩම, 49 කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 90 දරන බිම්කට්ටිය, 236.001, 21,626, 189,442 පිඹුරුවල සඳහන් ඉඩම් සහ කලු අග්ගල සිට ලබුගමට යන මහපාර ; බස්නාහිරට හකුරුදෙල සහ 363,782 පිඹුරේ සඳහන් ඉඩම.

#### II.—කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 49.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 69 | දුල්හේන්කන්ද | 0 | 1 | 24 |
| 72 | එම | 46 | 0 | 14 |
| | | 46 | 1 | 38 |

මීට මායිම්—උතුරට 49 කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 46 දරන බිම්කට්ටිය ; නැගෙනහිරට 7,284 මුල් සිතියමේ U 318 දරන බිම්කට්ටිය සහ හකුරුදෙල ; දකුණට කලු අග්ගල සිට ලබුගමට යන මහපාර ; බස්නාහිරට 19,065 මුල් මුල් සිතියමේ නො. 1 දරන බිම්කට්ටිය, 221,149 පිඹුරේ සඳහන් ඉඩම, 221,148 පිඹුර පිට අයිතිවාසිකම්කියන ඉඩම, 49 කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 71 දරන බිම්කට්ටිය, ඇල, 238,8[illegible]8 පිඹුර පිට අයිතිවාසිකම්කියන ඉඩම සහ අඳ දෙල.

#### III.—කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 49.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 73 | දුල්හේන්කන්ද | 15 | 3 | 38 |

මීට මායිම්—උතුරට 49 කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 46 දරන බිම්කට්ටිය ; නැගෙනහිරට ආඳදෙල සහ 120,210 පිඹුරේ සඳහන් ඉඩම ; දකුණට 119,883 පිඹුරේ සඳහන් ඉඩම, 49 කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 74 දරන බිම් කට්ටිය ; බස්නාහිරට 49 කැලෑ මැනීමේ මුල් සිතියමේ නො. 75 දරන බිම්කට්ටිය, කේ. පී. චාර්ලිස් අයිතිවාසිකම් කියන දෙල්ගහවත්ත, 223,119 සහ 223,118 පිඹුරුවල සඳහන් ඉඩම්.

නො. 1 දරන බිම්කට්ටිය. 7,284 මුල් සිතියමේ නො. U 318 දරන බිම්කට්ටිය, 17,941 මුල් සිතියමේ නො. 4 සහ 5 දරන බිම්කට්ටි ; දකුණට 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 72 සහ නො. 73 දරන බිම්කට්ටි සහ අඳදෙල ; බස්නාහිරට ඇම්. අස්සනාත්සිංඤෝ සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන හොරගහදෙනියෙල්ලේද, 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 67 දරණ බිම්කට්ටිය, ඇල, 132,702 සහ 251,590 පිඹුරුපිට අයිතිවාසිකම්කියන ඉඩම, 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 65 දරන බිම්කට්ටිය, ආර්. කොර්නේලිස් සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන ඊරියගහකුඹුර (5,041 මුල් සිතියමේ නො. (F 190 දරණ බිම්කට්ටිය), ඇල, 124,232 පිඹුරේ සඳහන් ඉඩම, 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 64 දරන බිම්කට්ටිය, 149,193 පිඹුරේ සඳහන් ඉඩම, ඇල, 118,888 පිඹුරේ සඳහන් ඉඩම, 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 63 සහ නො. 62 දරන බිම්කට්ටි, A 491 මුල් සිතියමේ නො. 1 දරන බිම්කට්ටිය, A 490 දරන මුල් සිතියමේ නො. 3 දරන බිම්කට්ටිය, 118,379, 126,162 සහ 126,163 පිඹුරුවල සඳහන් ඉඩම්.

II.—කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 49.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 47 | දුල්හේන්කන්ද නොහොත් හේනම්ඩිත මූකලාන .. | .. 74 0 20 |

මීට මායිම්—උතුරට 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 48 දරන බිම්කට්ටිය, 244,008 පිඹුරපිට අයිතිවාසිකම්කියන ඉඩම, 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 49 දරන බිම්කට්ටිය සහ 275,491 පිඹුරේ සඳහන් ඉඩම ; නැගෙනහිරට 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 50 දරන බිම්කට්ටිය ; දකුණට 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 76 දරන බිම්කට්ටිය සහ ඇල ; බස්නාහිරට හකුරුදෙල, 17,941 මුල් සිතියමේ නො. 6 දරන බිම්කට්ටිය, 7,284 මුල් සිතියමේ නො. U 813 දරන බිම්කට්ටිය, 17,941 මුල් සිතියමේ නො. 3 දරන බිම්කට්ටිය සහ 49 කැලෑමැනීමේ මුල් සිතියමේ නො. 48 දරන බිම්කට්ටිය.

---

## 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,399 (අනුරාධපුර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 28වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒවා කටයුතුකරණ බවද එකී ආඥාපනතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 18වෙනි දින කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ කන්තෝරුවේදීය.

සී. ඇෆ්. ඉන්ග්ල්ඩව්,
නිරවුල්කිරීමේ සහකාර නිලධාරීතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

(*c*) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුළත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරණු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම ලවමණනොවේ.

### උප ලේඛනය.

උතුරු මධ්‍යම දිසාවේ අනුරාධපුර දිස්ත්‍රික්කේ නුවරගම් පලාතේ උලගල්ලකෝරලේ වැව්තුලනේ ඉහල හිගුරුවැව යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියළුම බිම්කට්ටි, එනම් :—

උතුරට : තිරප්පනෙ සහ කච්චම්බුවගම යන ගම්වල ගම් ඉමද.

නැගෙණහිරට : කටුකෙලියාව යන ගම ගම්ඉමද.

දකුණට : කටුකෙලියාව, දෙමටවැව සහ ඇලපත්වැව යන ගම්වල ගම්ඉමද.

බස්නාහිරට ; කහපත්විල යන ගම් ගම්ඉමද.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 1,261.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | තම්මන්නාකන්දෙමූකලාන, කෝන්ගහ හේන .. | .. 49 1 4 |
| 2 | හිගුරුවැව (වැව සහ කන්ඩිය) | .. 37 1 29 |
| 3 | කදුරුගහයාය (වැව්කන්ඩිය දිගේ ඉතුරු කර තිබෙන බිම) .. | .. 1 3 15 |
| 4 | කෝන්ගහයාය, පරගහයාය | .. 4 1 21 |
| 5 | අඩිපාර .. | .. 0 0 11 |
| 6 | කෝන්ගහයාය, පරගහයාය | .. 5 1 32 |
| 9 | වැව (දියපාරෙ පුරාණපත්ල) | .. 0 0 11 |
| 10 | එම ( එම ) | .. 0 0 13 |
| | | 98 2 16 |

අනුරාධපුර නි. නි. 5—1936.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 12,001, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ ඔක්තෝබර් මස 16වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට කුලියාපිටියේ නානායක්කේදී වෙන්දේසියර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ අත්ගොමුකෝරලේ කොඩිපසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,422. ගම—දත්ගොල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | මීගහමුලවත්ත .. | වහලමුසිආරච්චිලාගේ දූසිහාමි, (2) එම හෙන්ද්‍රික්සිංඤෝ, (3) එම සියප්පූ විසින් හිගමුදල් ගෙවාහැත. | වත්ත | .. 7 0 32 |
| 6 | කදුරුගහමුල වත්ත | එම .. .. .. | එම | .. 3 1 0 |
| 7 | මසිලගහමුලහේන . | එම .. .. .. | හේන | .. 2 2 21 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක්වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ අගොස්තු මස 26වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

පලාත් පාලණය සම්බන්ධ කාරක මන්ත්‍රණ සභාවේ සම්මතය ඇතුව, වර්ෂ 1934ක්වූ ජූනි මස 22වෙනි දින ගැසට්පත්‍රයේ පළකරවනලද ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ නියමය පරිදි, වර්ෂ 1911යේ 10වෙනි ආඥාපණතේ 3වෙනි වගන්තියෙන් ප්‍රකෘතිමත් වර්ෂ 1876යේ 3වෙනි ආඥාපනතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර, මෙහි පහත දක්වන ඉඩම් ප්‍රසිඩ කටයුත්තක් සඳහා : එනම්, මෝදර විදියේ ප්‍රසිඩ වැසිකිළියක් තැනීම සඳහා ඒ ඉඩම් යුතුප්‍රකාර අයිත්කරගැනීමට අණලබනලදී. ඒ ඉඩම්නම් :—

ප්‍රාරම්භ පලෑන නො. A 590. ගම—කොටහේන, මෝදර කොඨාසය.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම කියාසිටින අයගේ නාම. | විශාලකම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වරිපනම් නො. 227/1 දරණ ඉඩම (මෝදර විදිය) | උළු සෙවිලිකළ, හුණෙන්බැදි ගොඩනැගිල්ලක්, කොටසක් සිමෙන්තියෙන්කළ ඉස්තෝප්පුවක කොටසක් හා මුඩුබිම් තීරයක්ද තිබේ | කොටහේනේ, මෝදර විදියේ ආර්. ලුසියා ප්‍රනාන්දු | 0 0 1·72 |
| 2 | වරිපනම් නො. 225 හා 227 දරණ ඉඩම් (මෝදර විදිය) | උළු සෙවිලිකළ, හුණෙන්බැදි ගොඩනැගිල්ලක් හා කොටසක් සිමෙන්තියෙන්කළ ඉස්තෝප්පුවක කොටසක්ද තිබේ | කොටහේනේ, මෝදර විදියේ රණසිංහආරච්චිගේ මනුවෙල් පෙරේරා | 0 0 1·72 |
| 3 | වරිපනම් නො. 217/5 දරණ ඉඩම (මෝදර විදිය) | උළු සෙවිලිකළ, හුණෙන් සහ මැටියෙන් බැදි ගොඩනැගිල්ලක් හා සිමෙන්තියෙන්කළ ඉස්තෝප්පුවක කොටසක්ද තිබේ | කොටහේනේ, මෝදර විදියේ ඩබ්ලිව්. ජුසේ ප්‍රනාන්දු | 0 0 1·89 |

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම් කියාසිටින අයගේ නම. | විශාලකම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | වරිපනම් නො. 221 හා 223 දරණ ඉඩම (මෝදර වීදිය) | උළු සෙවිලිකළ, හුණුගෙන්බැඳි ගොඩනැගිල්ලක්, සිමෙන්ති ගෙයන්කළ ඉස්තෝප්පුවක් හා මුඩුබිම් තීරයක්ද තිබේ | කොටහේනේ, මෝදර වීදියේ කේ. ඇස්. ප්‍රනාන්දු | 0 0 2·63 |

ඒ නිසා එකී ආඥාපණතේ 7වෙනි වගන්තියේ නියමවූ ප්‍රකාර ඉහතකී ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් මෙයින් ප්‍රකාශ කරමි.

තවද, එකී ඉඩම් ගැන සැලකිමක් ඇති සියලුදෙනාම ඔවුන්ගේ අයිතිවාසිකමේ අන්දමද, ඒ වෙනුවට ඉල්ලාසිටින වට්නාකමද, ඊට අයිති ඔප්පුද රිජිස්ටර් පොතේ කොපියක්ද රැගෙන ඉඩම් ගැන වට්නාකම ලැබීමට තිබෙන යුතුකමද, පෙන්වා සිටින පිණිස, තමන්ම හෝ තමන් වෙනුවට ක්‍රියාකරණ අය හෝ වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 19වෙනි සෙනසුරාදා පෙරවරු 10·30ට කොළඹ නාගරික සභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණෙන්ට ඕනෑය.

වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 24වෙනි දින
කොළඹ නාගරික සභා කන්තෝරුවේදීය.

ඩබ්ලිව්. ඇල්. මර්ෆි,
කොළඹ නාගරික සභාවේ සභාපති සහ නගරාධිපතිතුමා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර් 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කුරුවෙමුල්ලෙ මිශ්‍ර සහ ගැනු පාඨශාලාවලට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයම පලාත්ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 601. ගම්—ලාඋළුපිටිය සහ කුරුවෙමුල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කන්දෙවත්ත .. | වත්ත (හිස්බිම) .. .. .. | ආර්. ඒ. පොඩිහාමි, ලාඋළුපිටිය | 0 0 7·9 |
| 2 | එම .. | අවුරුදු 40ක් වයස පොල්ගස් 68ක් සහ වෙරළුගහක්ද, අවුරුදු 50ක් වයස කොස්ගස් 2ක්ද, අවුරුදු 25ක් වයස කැටකෑලගහක්ද, අවුරුදු 6ක් වයස නැදුන් ගහක්ද, අවුරුදු 30ක් වයස කිතුල්ගහක්ද, අවුරුදු 7ක් වයස රුක්අත්තනගහක් සහ ගොන්නගස් 2ක්ද, අවුරුදු 12ක් වයස දෙඹගහකින් යුක්ත ඉඩම | බී. හේමාවති රාජපක්ෂ, ලාඋළුපිටිය | 1 0 1·4 |
| 3 | ඇටම්ගේත්ත .. | අවුරුදු 35ක් වයස පොල්ගස් 41ක්ද, අවුරුදු 40ක් වයස කොස්ගස් 4ක්ද, අවුරුදු 7ක් වයස කොස්ගස් 3ක්ද, අවුරුදු 20ක් වයස පුවක්ගස් 22ක්ද, අවුරුදු 6ක් වයස පුවක්ගස් 2ක් සහ අඹගහක්ද, අවුරුදු 3ක් වයස කජුගස් 7ක් සහ රුක්අත්තනගහක්ද, අවුරුදු 10ක් වයස කජුගස් 4ක්ද, අවුරුදු 15ක් වයස කජු ගහක්ද, අවුරුදු 2ක් සිට 5ක වයස දෙඹිගස් 8ක්ද, අවුරුදු 9ක් වයස දෙහිගස් 2ක්ද, අවුරුදු 5ක් වයස රඹටන්ගහක්ද, අවුරුදු 2ක් වයස බෙලිගස් 2ක්ද, අතු සෙවිලිකරනලද වඩුම්බුවක්ද, ඉස්කෝල වලට පාවිච්චිකරන අතු සෙවිලි මැටි ගොඩනැගිලි 3ක්ද, අතුසෙවිලි මැටිගෙයක් සහ අතු සෙවිලි මැටි වැසිකිලියකින් යුක්ත ඉඩම | ඒ. කොරනේලිස් ද අල්විස්, ඒ. සාමින් ද අල්විස්, ඒ. බ්‍රම්පි ද අල්විස්, ඒ. ආර්ලිස් ද අල්විස්, ඒ. සිබල් ද අල්විස් සහ ඒ. සරනේලිස් ද අල්විස්, සියල්ලම කුරුවෙමුල්ල | 0 3 37·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින පෙරවරු 10යේ කනිසමට කුරුවෙමුල්ලෙ ආණ්ඩුවේ පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගනනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 24වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඇස්. ඇෆ්. අමරසිංහ,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තක්කුස්සි බාල්දි තැබීමට කාමරයක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුලප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A 401. ගම—මිනුවන්ගොඩ (කොටසක්) ගාළු නාගරිකයතුල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | චීනවෙල, වරිපනම් නො. 2 කොටසක් (නො. 5 වැකෑ) | වයස අවුරුදු 30–50 පොල් ගස් 2 ඇති ඉඩම | (1) දන්ගෙදර පදිංචි එච්. ආර්. පීරිස්, (2) කොළඹ පදිංචි පී. එච්. පීරිස් මහත්මී, (3) පී. ඩී. රුද්‍රිගු ප්‍රධාන මිනිඅරු තැනගේ කාර්යාලය, කොළඹ | 0 0 2·97 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින පෙරවරු 9යේ කනිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 22වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගුණරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නො. 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—රත්ගම සන්දියේ ප්‍රසිඩ වෙළඳම්පොලක් සහ තක්කුස්සියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 403. ගම—ගම්මැද්දෙගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මඩමයවත්ත .. | වයස අවුරුදු 50 පොල්ගස් 4 සහ මැටිගෙවල් දෙකක් තිබෙන පොල් ඉඩම | ගම්මැද්දෙගොඩ පදිංචි (1) යද්දෙහි සරදියෙල්, (2) එම උයනෙදුරිස්හාමි, (3) එම අංරෝලිස් සිල්වා, (4) ගුණෙනද්දහන්දි ඊවින් සිංඤෝ | 0 0 5·2 |
| 2 | මාදන්ගහවත්තනො හොත්මාවත බෝගහවත්ත | වයස අවුරුදු 25 පොල්ගස් 22, දෙල්ගස් 1 සහ මැටි ගෙයක්ඇති පොල් ඉඩම | ගම්මැද්දෙගොඩ පදිංචි (1) ඒ. ඩී. වෛද්‍යරත්න, (2) ආර්. අඩලියෙස්හාමි, (3) ආර්. ඉසබෙල්හාමි, (4) ආර්. තෝමස්අප්පු, (5) ආර්. පබලිස්හාමි, (6) ආර්. හෙන්ද්‍රික්අප්පු, (7) ආර්. එලියස්හාමි | 0 0 18·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින පස්වරු 2යේ කාලයමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 22වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගුණරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—මහමෝදර ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුම්ාණන් වහන්සේගෙන් යිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම් :—

සිතියමේ නො. A 395, ගම—මහමෝදර, ගාල්ලේ නාගරිකය ඇතුලත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සින්නතම්බිගෙවත්ත නොහොත් ප්‍රංශ කාරයගෙ වත්ත, වරිපනත් නොම්මර 55 කොටයක් (නොම්මර 7 වැක්ක) | වයස අවුරුදු 40–60 පොල් ගස් 34, කොටසක් හුනු බැම්මද, කොටසක් වරිච්චි මැටිබැම්ම, කොටසක් උළු සහ කොටසක් පොල් අතු සෙවිලිකල සෝල ගොඩනැගිල්ලද කොටසක් වරිච්චි බිත්ති සහ අතුසෙවිලිකල ගෙයද ඇති පොල් ඉඩම | (1) ගාල්ලේකොටුවේ පදිංචි ඇස්. ඇල්. සයිසි උම්මා, (2) එම සේගු මැග්ඩන් මහත්මී, (3) එම ඇස්. ඇම්. ජුනෙයිදු මහත්මී, (4) ගාල්ලේ කලාපිටියේ ඇස්. ඒ. සී. අබ්දුල්කාදර්, (5) කොළඹ ඇම්. ඒ. කාදර්, (6) ගාල්ලේ කොටුවේ ඇස්. ඒ. සී. හෆීර්, (7) එම ඇස්. ඒ. ඩී. දීන් (බාල වයස්කාර), (8) එම ඇස්. ඇල්. ඇම්. හනීෆා මහත්මී, (9) එම එච්. එච්. ඒ. හමිදු මහත්මී, (10) ගාල්ලේ ඇෆ්. ඇම්. දීන් පෙරකදෝරු මහත්මයා, (11) ගාල්ලේ කොටුවේ ඇම්. නාසිම්, (12) එම ඇම්. ඒ. නාසිම්, (13) එම ඒ. සී. නාසිම් මහත්මී, (14) එම ඒ. ඩබ්ලිව්. මහමත් මහත්මී, (15) එම එච්. නාසිම් මහත්මී (බාල වයස්කාර), (16) එම අහමද් මහත්මී, (17) එම ඇන්. ඒ. නාසිම් මහත්මී, (18) මහමෝදර යූ. ඇස්. ද අල්විස් වික්‍රමසේකර මහත්මී, (19) බී. මර්තේනිස්, මහමෝදර පොලිස් මූලාදෑනියා | 0 1 0·97 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින පෙරවරු 10යේ කාලයමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 22වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගුණරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—මිරුසුවිල් රෝමානු පල්ලියේ සිට ආණ්ඩුවේ පාඨශාලාවට යාමට තෙරුවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුම්ාණන් වහන්සේගෙන් යිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම් :—

සිතියමේ නො. A 1,054. ගම—මිරුසුවිල්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සෙම්පාඩු .. | අවුරුදු 25–30ත් අතර වයසැති පොල්ගස් 5ක්ද, අවුරුදු 3ක් පමණ වයසැති පොල්පැල තුනක්ද ඇති පොල්වත්තක් | (1) මිරුසුවිල් උප්පැන්න මරණ ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැන්පත් නීක්කිලාපිල්ලේ සින්නප්පූ පිලිප්පුපිල්ලේ සහ ඔහුගේ සහෝදරී මතලයිපිල්ලේ, (2) පේද්‍රුපිල්ලෙගේ වැද්දඹු සූසානම්, (3) අන්තෝනිපිල්ලේ අගුස්තීන්, (4) අන්තෝනි පිල්ලේ ලාසුරුස්, (5) සින්නපිල්ලෙගේ ස්ත්‍රී එලිසබෙත් නොහොත් සින්නාච්චි, (6) නීක්කිලස් මරියලීන්, (7) වයිත්තියාම්පිල්ලෙ බේනාඩ්, (8) පිල්ප්පු පිල්ලේ මිරුසුවිල් පදිංචි | 0 0 10·8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ඔක්තෝබර් මස 5වෙනි දින පෙරවරු 10යේ කාලයමට සාවකච්චේරියේ රෙස්ට්හවුසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. අයිතිවාසිකම් ඔප්පුකිරීමට ඉඩම්වල ඔප්පුත් ගෙනෙන්ට ඕනෑය.

වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 13වෙනි දින යාපනේ කච්චේරියේදීය.

ජී. ටී. ෆෙඩසන්,
උ. ප. ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## දැන්වීමයි

### බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901යේ ආඥාපණත.

1901යේ බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ ආඥාපණතේ 5වෙනි වගන්තිය යටතේ අනුරාධපුරේ නගරබද ප්‍රදේශ සභාවට අයත් සීමා තුලට නියම අධිකාරීහු විසින් පනවනලද උපනීති.

ඇස්. නටරාජ්.
අනුරාධපුරේ නගරබද ප්‍රදේශ සභාවේ ප්‍රධානතැන.

වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 6වෙනි දින අනුරාධපුරේදීය.

1933යේ පෙබරවාරි මස 17වෙනි දින නො. 7,968 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවුන 1933යේ ජනවාරි මස 23වෙනි දින දරන උපනීතිවල නො. 1 දරන උපනීතියේ "අනුරාධපුරේ නගරබද" යන්න සිට "ගෙවිය යුතුයි" යන්න දක්වා වගන්තය අවලංගුකර ඒ වෙනුවට මෙහි පහත පෙනෙනාකාර මෙයින් වෙනස්කරන්ට යෙදුනා ඇත.

"අනුරාධපුරේ නගරබද ප්‍රදේශ සභාවට අයත් සීමා තුල තබාගෙන සිටින එක එක බල්ලා හෝ බැල්ලී ගැන ඒ සතා රැකබලාගන්නා අය හෝ අයිතිකාරයා විසින් ලියාපදිංචි කිරීම සඳහා අවුරුදු පතා ගෙවන ගාස්තුවක් වශයෙන් මෙහි පහත සඳහන්වන ගනන් ගෙවිය යුතුය.

(a) බල්ලෙකුට රු. 1·00

(b) බැල්ලියෙකුට රු. 1·50."

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.